සන්නස
SANNASA




# දකුණේ ස්ත්‍රීවාදිනියක සමඟ සම්මුඛ වූ දිනයක්

## සන්නසට සකස් කරන්නේ ශ්‍රීලාල් සෙනෙවිරත්න

ප්‍රවාහන මාර්ග විවෘත කිරීමෙන් පසුව ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන බොහෝ ප්‍රමාණයක් දෙමළ ජනයා වාසය කරන ප්‍රදේශ තුළට තම නව සංකල්ප සමඟ පැමිණියහ. 'සාමය ගොඩනැංවීම', 'ජාතීන් අතර ඒකාබද්ධතාව ඇති කිරීම' යනාදී වශයෙන් වූ ඔවුන්ගේ සැළසුම්වල සංකල්ප යන්හි මාතෘකා කණට ඇසීම පවා කොටින් තුළ අජීර්ණයක් ඇති කිරීමට සමත්විය. එහෙයින් කිසිම ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානයක් කෙලින්ම ජනතාව අතරට ගොස් වැඩ කිරීම පිළිබඳව කොටි කැමති වූයේ නැත.

කිලිනොච්චියේ කොටි ස්ථාපිත කර තිබූ සැළසුම්කරන ලේකම් කාර්යාලයෙහි මඟ පෙන්වීම යටතේ ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානවලට ජනතාව අතරෙහි වැඩ කළ හැකිය යනුවෙන් කොටින් විසින් කොන්දේසිද පනවන ලදි. පීඩාවට පත් ජනයා පිළිබඳ සංඛ්‍යා ලේඛනත්, ජනතා අවශ්‍යතා පිළිබඳ විශ්ලේෂණ වාර්තා ද, ජනතාව වෙනුවෙන් කළ යුතු වැඩ කොටස පිළිබඳ මාදිලි සැළසුම් ද කිළිනොච්චියෙහි වූ සැළසුම්කරන ලේකම් කාර්යාලයෙහි සකස් කර තිබුණි. බැහැරින් එන ඕනෑම සංවිධානයක් දෙමළ ජනතාව අතරට ගොස් සංඛ්‍යා ලේඛන හා දත්ත එක්රැස් කිරීම හෝ ජනතාවගේ ප්‍රශ්න ගැන ජනතාව සමඟ කතා බහ කිරීම පිළිබඳව හෝ කොටි බිඳක් වත් කැමති වූයේ නැත. සාම ක්‍රියාදාමයෙහි ආරම්භක දවස්වල විවිධ වර්ණ කොඩි ලෙළ දෙමින්, පහසුවෙන් තේරුම්ගත නොහැකි විවිධ අලුත් නම් සහිතව රාජ්‍ය නොවන සංවිධානවල වාහන රාශියක් ඒ නවය මාර්ග යෙහි සැරිසැරීම ජනයා විනෝදාත්මක ලෙසින් බලා උන්නෝය. එහෙත් කොටින්ගේ කොන්දේසිවලට ඔරොත්තු දිය නොහැකිව බොහෝ රාජ්‍ය නොවන සංවිධාන මියෙම්වා රැකෙම්වා යැයි කියා පලා ගියෝය.

උතුරු ප්‍රදේශයේ යුද්ධයෙන් නිවෙස් අහිමි වූ ජනයාට ස්ථිර නිවාස ලබාදීමේ සැළසුම් රැගෙන බොහෝ සංවිධාන පැමිණි අවස්ථාවේ කොටින්ගේ උපදෙස්වලට අනුව එම නිවෙස් ඉදිකළ යුතුය යනුවෙන් නියෝග නිකුත් විය. ඔවුන් සඳහා වූ සාකච්ඡාවට මමද සහභාගි වූවෙමි. උතුරු පෙදෙස වියලි ප්‍රදේශයක් වන හෙයින් නිවෙස්වල සාමාන්‍ය ඇලුමිනියම් සෙවිලි තහඩු භාවිතා කළ නොහැකි බවත්, එමෙන්ම මිනිසුන්ගේ සෞඛ්‍යයට හානි කරන බව කියන ඇස්බැස්ටස් තහඩුද සෙවිලි කළ නොහැකි බවත් දීර්ඝ කාලීන භාවිතයට ඔරොත්තු දෙන සහ සිසිලස ලබා දෙන උළු භාවිතා කළ යුතු බවත් එසේත් නැතිනම් එයට ගැළපෙන ලෙසින් විකල්ප මාර්ග ගැන අවධානය යොමු කළ යුතු බවත් කොටින්ගේ පාර්ශ්වයෙන් ඉදිරිපත් කළේය. එම රැස්වීමේදී කාන්තා සංවිධාන වෙනුවෙන් අපි ද අදහස් ඉදිරිපත් කළෙමු. එනම් ගෙවල්වල පාලනය සිදුකරන්නේ බොහෝ ලෙසින්ම කාන්තාවන් වන නිසා නව ස්ථිර නිවාස ඉදිකිරීමේදී කාන්තාවන් සහ ළමුන් උදෙසා විශේෂ අංශ පිළිබඳව අවධානය යොමු කළ යුතු බවත්, ඒ අනුව මුළුතැන්ගෙය තරමක් විශාල වන්නටත්, මුළුතැන්ගෙයි දුම නියමිත අයුරින් එළියට යැවෙන දුම් කවුළු සහිතවත්, නිවෙසේ වැඩිහිටියෝ දොර ජනෙල් වසා නිවෙසින් බැහැරව ගොස් සිටින විට පාසළ ඇරී ගෙදරට එන ළමුන්ට මඳ වේලාවක් වෙහෙස නිවා ගත හැකි අයුරින් විවෘත කොටසකින් යුතුව නිවෙසෙහි ඉදිරිපස සකස් විය යුතු බවත් අපි පැවසුවෙමු.

මක්නිසාද යත්, දර භාවිතයෙන් උයන නිවෙස්වල දුම් කවුළු නොමැති තත්ත්වයක් තුළ කාන්තාවන් දිගින් දිගටම එම දුම ආශ්වාස කිරීමෙන් ඇතිවන රෝග පිළිබඳ වන අත්දැකීම් බොහෝ කාන්තාවන් අප සමඟ බෙදා හදාගෙන සිටි බැවිනි. අපේ ඉල්ලීම පිළිගත් බොහෝ ආයතන තමන් විසින් ගොඩනංවනු ලබන නිවෙස්වල මෙ වැනි ව්‍යුහාත්මක වෙනස්කම් සිදුකර තිබුණි.

2003 වසර ආරම්භයේදී සාම සාකච්ඡා ශක්තිමත් කිරීමේ ක්‍රියා මාර්ගයක් ලෙසින් රජයේ පාර්ශ්වයෙහි කාන්තා නියෝජිතයන් සහ කොටින්ගේ පාර්ශ්වයෙහි කාන්තා නියෝජිතයන්ගේ සාකච්ඡාවක් නෝර්වේ මැදිහත්වීම මත කිලිනොච්චියේ සාම මහ ලේකම් කාර්යාලයේදී පැවැත්විය. රජයේ පාර්ශ්වයෙහි කාන්තා නියෝජිත පිරිස මුස්ලිම් කාන්තාවන් දෙදෙනෙකුද ඇතුළත්ව පස්දෙනෙකුගෙන් යුක්ත විය. ඔවුන්ගේ නායකත්වය දැරුවේ ආචාර්ය කුමාරි ජයවර්ධනය. ජ්‍යෙෂ්ඨ ස්ත්‍රීවාදිනියක සහ සමාජ පර්යේෂිකාවක් වූ ඇය බොහෝ පර්යේෂණ ග්‍රන්ථ රචනා කර ඇත. ඇය සමඟ සහභාගි වූ සියලු දෙනාම ස්ත්‍රී වාදය, සමාජය, නීතිය, වෛද්‍ය වෘත්තිය වැනි ක්ෂේත්‍රවල ක්‍රියාත්මක වූ අය වෙති. විමුක්ති කොටින්ගේ පාර්ශ්වයෙන් ප්‍රධාන සාකච්ඡාකරු ලෙස මා පත්කර තිබුණි. මා සමඟ දේශපාලන අංශයේ ක්‍රියාකාරී සටන්කාමී සහෝදරියෝ සිවු දෙනෙකු සහභාගි වූහ. ඔවුහු සමාජයෙහි කාන්තාවන් අතරේ වැඩ කර දීර්ඝ කාලීන අත්දැකීම් ඇති අය වූහ. මඩකලපුව ත්‍රිකුණාමලය ආදී ප්‍රදේශද නියෝජනය වන අයුරින් ඔවුන්ව තෝරාගෙන තිබුණි. මෙම හමුවට අනුග්‍රාහකත්වය දැරුවේ නෝර්වේ රජයේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරියක් සහ සමාජ විද්‍යාත්මක පර්යේෂිකාවක් වූ ඇස්ට්‍රිප් හෛබර්ග් මැතිනියයි. ඇය ද මෙම සාකච්ඡාවට සහභාගි වූවාය.

විමුක්ති කොටි සංවිධානයේ දේශපාලන උපදේශක ඇන්ටන් බාලසිංහම් මහතා අපව සූදානම් කළේය. සාම සාකච්ඡා ඉදිරියට ගෙන යාමේදී මෙවැනි උපහමුවීම් වැදගත් භූමිකාවක් සහිත බව ඔහු පැවසුවේය. ලංකාවේ පැවැති දීර්ඝ කාලීන යුද්ධය හේතුවෙන් යුද්ධයට සම්බන්ධව සිටි දෙපාර්ශ්වයටම අයත් කාන්තාවෝ අධික ලෙසින් අහිමිවීම්වලට සහ ජීවන අර්බුදයන්ට මුහුණ දී ඇත යන පදනමින් මෙවැනි හමුවක් කාන්තා නියෝජිතයන් අතරෙහි පවත්වා ඔවුන් විසින් ඒ පිලිබඳ අධ්‍යනය කර ගනු ලබන තීරණ මත පදනම්ව කාන්තාවන් සඳහා වූ විශේෂ අවශ්‍යතාවයන් ද සැළකිල්ලට ගෙන වැඩ සැළසුම් සකස් කරන බවත්, අවශ්‍යතාව මතු වෙන විට ප්‍රධාන සාකච්ඡා මේසයට කාන්තා නියෝජිතයන්ව කැඳවනු ඇති බවත් ඔහු පැවසුවේය.

''ලංකාවේ දකුණෙන් පැමිණෙන කාන්තා නියෝජිතයෝ හොඳට ඉගෙන ගත්ත අය. නමුත් ඒකට ඔයාලා බය වෙන්න ඕනෑ නෑ. මේ යුද්ධ වාතාවරණය තුළ ජීවත් වෙන කාන්තාවන්ගේ ප්‍රශ්න ගැන සජීවී අත්දැකීම් ඔයාලට තියනවා. මට ඔයාලා ගැන විශ්වාසයක් තියනවා. ඔයාලා නූගත් ආචාර්යවරු' යැයි පවසා ඔහු අපව දිරිමත් කළේය. එමෙන්ම අප තුළ වූ සැක සංකා සහිත කරුණු ඔහු සමඟ කතා කර නිරවුල් කරගත්තෙමු. සමූහ ඝාතන පිළිබඳ කරුණු ඒ අතර ප්‍රධාන තැනක් ගනියි. නැගෙනහිර පළාතේ සිදුවූ සමූහ ඝාතන, පොදු ජනතාව මතට එල්ල කෙරුණු ගුවන් ප්‍රහාර ආදියෙන් බහුල ලෙසින් කාන්තාවන් සහ ළමුන් මරණයට පත්වී ඇති බවත්, ඒ පිළිබඳවත් අදාළ සාකච්ඡාවේදී කතා කළ යුතු බවත් අපේ සටන්කාමී සහෝදරියෝ තම අදහස් ඉදිරිපත් කළ අවස්ථාවේ ඇන්ටන් බාලසිංහම් මහතා එය ප්‍රතික්ෂේප කළේ පහත සඳහන් හේතුව ඉදිරිපත් කරමින්ය.

''සමූහ ඝාතන සිද්ධ කෙරුවේ ඒ අය විතරක්ය කියලා හිතන්ඩ එපා. කොටිත් තොත්ත බබාලා නෙවෙයි. අපි සමූහ ඝාතනවල ලැයිස්තුවක් ඉදිරිපත් කළොත් ඒ අයත් කොටි කරපු සමූහ ඝාතනවල ලැයිස්තුවක් දෙයි. ඒ හින්දා මේ වගේ ප්‍රශ්න හාරා අවුස්සන එක දෙපාර්ශ්වයටම ප්‍රශ්නයක් වෙයි. කාන්තාවන්ගේ ජීවිතේ වැඩි දියුණු කළ හැකි මාර්ග ගැන සොයා බලන එක වැදගත්. ඒ අයගේ අත්දැකීම් ඔබලාත්, ඔබලාගේ අත්දැකීම් ඒ අයත් බෙදාගැනීමයි ප්‍රයෝජනවත් වෙන්නේ. ඔබලාගේ අනාගත සැළසුම් ප්‍රධාන සාකච්ඡා මේසයට අනිවාර්යෙන්ම එයි. මක්නිසාද කියනවා නම් අද කාලේ ලෝකේ ස්ත්‍රී විමුක්තිය ගැන කරුණු ප්‍රධාන තැනකට ඇවිත් තියනවා. මෙච්චර කාලයක් පැවතිච්ච සාකච්ඡාවල දී මේ වගේ හමුවීමක් කෙරිලා නෑ. ඒ නිසා මේක ඉතාමත් හොඳ අවස්ථාවක්. මේක නිවැරදි විදිහට භාවිතා කරලා පීඩාවට පත්වෙච්ච අපේ ජනතාවට විශේෂයෙන්ම කාන්තාවන්ට බොහෝ සංවර්ධන සැළසුම් සකස් කරන්ඩ පුළුවන් පරිසරයක් ඇති කරන්ඩ ඕනේ'' යනුවෙන් ඔහු බොහෝ උදාහරණ සහ පැහැදිලි කිරීම් සමඟ අපට ඉදිරිපත් කළේය.

රජයේ පාර්ශ්වයට අයත් නියෝජිතවරියෝ ලංකාවේ ගුවන් හමුදාවට අයත් හෙලි කොප්ටරයකින් කිලිනොච්චි ක්‍රීඩා පිටියට පැමිණියහ. මහා මාර්ගයෙන් පැමිණි නෝර්වේ මැදිහත්කරුවන් නතරව උන්නේ කිලිනොච්චි වැවට ආසන්නයෙහි වූ 'රාංවියු' හෝටලයෙහිය. උදේ දහයට පමණ විමුක්ති කොටින්ගේ සාම ලේකම් කාර්යාලයෙහි දී ඉතිහාසයේ ප්‍රථම වතාවට රජයේ පාර්ශ්වයෙහි සහ කොටි පාර්ශ්වයෙහි කාන්තා නියෝජිතයෝ නෝර්වේ මැදිහත්කරුවන්ගේ ඉදිරියෙහි සම්මුඛ වූහ. එකිනෙකා හඳුනාගැනීම්වලින් පසුව මැදිහත්කරුවන්ගේ ප්‍රමුඛත්වයෙන් ප්‍රධාන කරුණු පිළිබඳව සාකච්ඡා කෙරුණි. යුද්ධයෙන් පීඩිත දෙමළ කාන්තාවන්ගේ ප්‍රශ්න ඉදිරිපත් කරමින් කොටි පාර්ශ්වය වෙනුවෙන් මම අදහස් දැක්වූවෙමි.

කාන්තාවන්ගේ පීඩාවන් පිළිබඳව බොහෝ දත්ත සහ සංඛ්‍යාලේඛන ඉදිරිපත් කළෙමි. රජයේ පාර්ශ්වයේ ප්‍රධාන සාකච්ඡාකරු ලෙසින් පැමිණ සිටි ආචාර්ය කුමාරි ජයවර්ධන 'ජාතිය, භාෂාව කියන දේවල්වලට ඔබ්බෙන් අපි කාන්තාවෝ. මේ රටේ සිදුවෙච්ච යුද්ධය හේතුවෙන් කාන්තාවන් ඉතාමත් අධික ලෙසින් දුක් විඳිනව කියන කාරණය මූලික කරගෙන මේ සාමකාමී වාතාවරණය තුළ අපි එකට එකතුවෙලා කාන්තාවන් වෙනුවෙන් කළ හැකි වැඩ කටයුතු මොනවාද කියලා සාකච්ඡා කරමු.' යනුවෙන් සාකච්ඡාව ආරම්භ කළාය. එයට පසුව හවස් යාමය තෙක් සාකච්ඡා පැවැත්විණ. යුද්ධයෙන් සැමියා අහිමි වූ සිංහල කාන්තාවන් මුහුණ දෙන දුක්ඛදායක තත්ත්වයන් ගැනත්, යුද්ධයෙහි දී අතුරුදහන් වූ හමුදාවේ අය සොයමින් දුක් විඳින පවුල් පිළිබඳවත්, මායිම් ගම්මාන කොටි ප්‍රහාරවලට ලක් වූ අවස්ථාවල අවතැන් වෙන සිංහල පවුල් පිළිබඳවත්, ඔවුන්ගේ ජීවනෝපාය පිළිබඳ ප්‍රශ්න පිළිබඳවත් ඔවුහු බොහෝ ප්‍රශ්න ඉදිරිපත් කළහ. අවසානයෙහි දී කාන්තාවන් සඳහා වන සාම ලේකම් කාර්යාලයක් ස්ථාපිත කිරීමටත්, එම ස්ථානය පදනම් කරගෙන කාන්තාවන් සඳහා වන කටයුතු ඊළඟ අදියර කරා ගෙන ගිය හැකි බවටත් තීරණය කෙරුණි.